
# සාමයේ ප්‍රතිලාභය රටට දෙන්න පුළුවන් ජනාධිපතිතුමාට පමණයි



ලංකා ජාතික සංගමයේ නායක අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමැති
**මිලින්ද මොරගොඩ**

උණුසුම් තරගයක් බවට පත්ව තිබෙන ජනාධිපතිවරණය සම්බන්ධව මිලින්ද මොරගොඩ අමාත්‍යතුමා සමග කරන ලද සංවාදයකි.

**ප්‍රශ්නයඃ- කොටි ත්‍රස්තවාදය පරාජයෙන් පසුව පැවැත්වෙන ප්‍රථම ජාතික මැතිවරණයයි මේ ජනාධිපතිවරණය. මේ මැතිවරණයේදී ජනතාවට පැවරෙන වගකීම කවර ආකාරද?**

**පිළිතුරුඃ-** තිස් අවුරුදු යුද්ධය නිසා අපේ රටට ලැබිය යුතුව තිබූ ආර්ථික හා සමාජ දියුණුව ලැබුණේ නැහැ. දැන් යුද්දේ ඉවරයි. දැන් තිබෙන අභියෝගය තමයි රට එකතු කරන එක හා ආර්ථික දියුණුව ඇති කිරීම. මේ සඳහා අපට හරි පාරෙන් ඉදිරියට යන්නත් පුළුවන් නැතිනම් නැවත පාර වරද්ද ගන්නත් පුළුවන්.

**ප්‍රශ්නයඃ- මෙහිදී ඔබ හරි පාර කියන එකෙන් අදහස් කරන්නේ කුමක්ද?**

**පිළිතුරුඃ-** අප හැමෝම එකතු වී එක ඉලක්කයකට යන්න ඕනෑ. සමාජය දියුණු කරන්න. ඒක තමයි හරි පාර. ඒ පාරෙ ගියොත් අපට වරදින්නෙ නැහැ.

**ප්‍රශ්නයඃ- නමුත් සමාජයේ තිබෙන දේශපාලන පක්ෂ බෙදීම් අමතක කරල එවැනි ගමනක් යන්න පුළුවන්ද?**

**පිළිතුරුඃ-** ඒ කාරණයෙදි තමයි අපට හරි නායකයෙක් ඕනෑ කරන්නෙ. මේ ජනාධිපතිවරණයෙදි අපි බලන්න ඕනෑ කාටද පුළුවන් රට එකතු කරන්න කියන එක ගැනයි. මේ දක්වා රට එකතු කරල පෙන්නල තිබෙන්නෙ කව්ද? කාටද ඒ ගැන අවුරුදු තිහ හතළිහක අත්දැකීම් තියෙන්නෙ කියන කාරනේදි අපට තෝරා ගන්න ඉන්නෙ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පමණයි.

**ප්‍රශ්නයඃ- ඔබ රජයේ ඇමැතිවරයෙක් නිසාද ඔය කතාව කියන්නෙ?**

**පිළිතුරුඃ-** නැහැ. මම බලන්නේ පුළුල් තත්ත්වයයි දැන් කෙනෙක් ඇහුවොත් ඇයි මම ජනාධිපති රාජපක්ෂ මහත්මයට උදව් කරන්නෙ කියල මම කියන්නෙ එතුමාට මේ රට එකතු කරන්න, සංවර්ධනය කරන්න හොඳ දර්ශනයක් තිබෙන නිසා එතුමාට උදව් කරනවා කියලයි. මම කොටි සංවිධානය සමග වාර ගණනාවක් සාකච්ඡාවලට ගිය කෙනෙක්. ඒකෙන් මම ඉගන ගත් පාඩම තමයි ප්‍රභාකරන් කියන පුද්ගලයා ජීවිතේ කිසිමදාක දේශපාලන විසඳුමකට එන්නේ නැති බව. ඒ තත්ත්වයට මුහුණ දෙන්න පුළුවන් රාජපක්ෂ ජනාධිපතිතුමාටයි කියල මා විශ්වාස කළා. ඒ අනුව ජනාධිපතිතුමාගේ ආරාධනාව අනුව රජයට සහාය දෙන්න ඉදිරිපත් වුණා.

**ප්‍රශ්නය ජනාධිපතිතුමාගේ අවුරුදු 4ක පාලන කාලය තුළ ඔබ රජයට එක්වීමේදී අපේක්ෂා කළ අරමුණ ඉටුවී තිබෙනවා ද?**

**පිළිතුරුඃ-** ඔව් එතුමා ත්‍රස්තවාදය හමාර කළා. එපමණක් නොවෙයි විවිධ මත දරන විවිධ පක්ෂවල හා ජාතිවලට අයත් අය සමග කදිම ආණ්ඩුවක් ගොඩනගා රාජ්‍ය පාලනය කළා. මේ රටේ ඉතිහාසයෙ කොයිතරම් දක්ෂ දේශපාලනඥයො හිටියද නමුත් ඒ කාටවත් මේ දක්ෂකම කරන්නට බැරි වුණා. යුද්දේ ඉවර වුණාට පස්සෙ අපට යන්නට තිබෙන ගමන යුද්දෙටත් වඩා දුෂ්කර ගමනක්. ඒ ගමනෙදි රටට නායකත්වය දෙන්න සුදුසුම පුද්ගලයා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පමණයි. ඒ ගැන තර්ක දෙකක් නැහැ. මේ රටට සාමයෙ ප්‍රතිලාභය ලබා දෙන්න පුළුවන් එතුමාටයි.

**ප්‍රශ්නය ජනාධිපතිවරණයේ උණුසුම උග්‍රවෙමින් තිබෙනව. ඔබට පෙනෙන විදියට මෙම ඡන්දයේ තීරණාත්මක සාධක ලෙස පෙනෙන්නේ මොනවාද?**

**පිළිතුරුඃ-** මට පෙනෙන්නේ ප්‍රතිපත්තිවලට වඩා වෛරය ඉස්මතු වී තිබෙන බවයි. ඒක හොඳ නැහැ. වේදිකාවෙ කතාවලින් වෛරය ඉස්මතු වෙනව. ජනාධිපතිවරණ ඉතිහාසෙ මේ ආකාරයට වෛරය ඉස්මතු වූ අවස්ථාවක් මට මතක නැහැ. ජනාධිපතිතුමාට මෙතෙන්දි ලොකු අසාධාරණයක් වෙනව.

**ප්‍රශ්නයඃ- මොකක්ද ඔබ කියන අසාධාරණය**

**පිළිතුරුඃ-** ජනාධිපති රාජපක්ෂ මහතා ගමෙන් ආපු කෙනෙක්. එතුමා මේ රටේ දේශපාලනයට සම්බන්ධ ප්‍රධාන පවුල්වලින් ආපු කෙනෙක් නොවෙයි. ඒ නිසා සමහරු හිතනව ඇති රාජපක්ෂ මැතිතුමාට මේ තනතුර දරන්න අයිතියක් නැහැ. කියලා. ජනාධිපතිතුමාට යන්න කියන අයගෙ මතය දැන් යුද්දෙ ඉවරයි. ඒ නිසා ඔයා යන්න. රට හදන්න පුළුවන් අපට විතරයි. ඒ නිසා රට අපට භාර දෙන්න කියන ඒකනේ. ඒක හරිම අසාධාරණ කතාවක්. ඒ නිසා තමයි මම එතුමාට සහාය දෙන්න ගත්ත තීරණයේ දැඩිව ඉන්නෙ. ඕක ප්‍රේමදාස ජනාධිපතිතුමාට වෙන විදියකට සිද්ධ වුණා.

> **මේ ජනාධිපතිවරණයෙදි අපි බලන්න ඕනෑ කාටද පුළුවන් රට එකතු කරන්න කියන එක ගැනයි. මේ දක්වා රට එකතු කරල පෙන්නල තිබෙන්නෙ කව්ද? කාටද ඒ ගැන අවුරුදු තිහ හතළිහක අත්දැකීම් තියෙන්නෙ කියන කාරනේදි අපට තෝරා ගන්න ඉන්නෙ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පමණයි.**

**ප්‍රශ්නයඃ- ඔබ නිදහස් මතධාරියකු හැටියට මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ ජනාධිපතිතුමාට සහ එතුමාගේ පවුලේ අයට එල්ලකරන චෝදනා ගැන මොකද හිතන්නෙ.**

**පිළිතුරුඃ-** ඔය චෝදනා එකක්වත් මේ දක්වා ඔප්පු කරල තියනවද? නැහැනේ. ආරක්ෂක ලේකම්තුමා ඇපලෝ ඉස්පිරිතාලෙ ගත්තලු. මේක ඇත්තද පුංචි ළමයෙකු වුණත් දන්නවනේ මේක බොරු බව. සාමාන්‍යයෙන් ඡන්දයකට කලින් ඔය දූෂණ කතා පතුරවනව. 1994 චන්ද්‍රිකා මැතිනිය කිව්ව රටේ දූෂණය නැතිකරල ඒ ඉතිරිවන මුදලින් පාන්ගෙඩිය රු. 3.50ට දෙනවය කියල. ඒක සිද්ධ වුණා ද? මේ පාරත් දූෂණය නැතිකරල නොයෙක් දේවල් කරනවය කියනව. පඩිය වැඩි කරන්න පුළුවන්ලු. මේව සිද්ධ වෙන දේවල් නොවේ. මේ රටේ ජනතාව හුඟක් බුද්ධිමත් කොටසක්. ඒ නිසා මම කියන්නෙ මේ මැතිවරණ ව්‍යාපාරය බොරු චෝදනා නැති ප්‍රතිපත්ති විවාදයක් විය යුතුයි. මේක විපක්ෂයටත් රජයටත් දෙකටම මම කියනව. ප්‍රතිපත්ති විවාදයක් බවට ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරය පත්වුණොත් එතන දීත් ජනාධිපතිතුමාගෙ ක්‍රියාකලාපය ජනතාව අගය කරාවි.

**ප්‍රශ්නයඃ- මේ ඡන්දය යුද්ධ ජයග්‍රහණයේ කීර්තිය බෙදා ගැනීමේ සටනක් බවට පත් වී තිබෙනවා. යුද්ධයේ සැබෑ වීරයා තෝරන සටනක් ලෙසත් ජනාධිපතිවණය හැඳින්විය හැකියි. ඔබ කියන විදියට යුද්ධ ජයග්‍රහණය බෙදාගත යුත්තේ කොහොමද?**

**පිළිතුරුඃ-** ලෝකයේ ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක කීර්තිය වගේම වරදත් භාර වන්නේ රාජ්‍ය නායකයාටයි. ඒක ගැන තර්ක කිරීමත් නිෂ්ඵල දෙයක්. දෙවැනි ලෝක මහා යුද්ධය ගනිමු. හුඟක් ජෙනරාල්ල හිටියා. නමුත් යුද්ධයේ වීරයන් වුණේ ඇමෙරිකාවෙ රූස්වෙල්ට් ජනාධිපතිතුමාත් බ්‍රිතාන්‍යයේ වින්ස්ටන් චර්චිල් අගමැතිතුමත්. යුද්ධයක් කියන්නෙ හමුදාව මෙහෙයවීම පමණක් නොවෙයි මුළු මහත් රටක සමාජයම ඒ සඳහා මෙහෙයැවීමයි. ඒක මෙහෙදි කළේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමයි. එතුමා යුද්ධය සඳහා අණ දුන්නේ නැත්නම් සම්පත් දුන්නේ නැත්නම් හමුදාපතිවරුන්ට තනියම යුද්ධය කරල රට බේරාගන්න පුළුවන් ද? රටේ යුද්ධයක් සිද්ධ වේවිද? ඕකයි මෙතෙන්දි මතුවන ඉතාම සරල ප්‍රශ්නය.

**ප්‍රශ්නයඃ- මේ වසරේ ජනාධිපතිවරණයක් පැවැත්වීමට නියම වී තිබුණේ නැහැ. යෝජිතව තිබුණේ මහමැතිවරණයයි. ජනාධිපතිතුමා අනවශ්‍ය වේලාවක ජනාධිපතිවරණයකට ගිය බවට සමහරු තර්ක කරනව. මේ තර්කය ගැන ඔබේ මතය කුමක්ද?**

**පිළිතුරුඃ-** යුද්ධ ජයග්‍රහණයෙන් පස්සෙ එතුමාට කිසියම් ඡන්දයක් තියන්නම තිබුණා. ඉතින් ඒ සඳහා ජනාධිපතිවරණය තෝරාගත්ත. ඒ ගත්ත තීරණය හරි. එතුමා දැන් රටට ගිහිල්ල කියන්නෙ මම ත්‍රස්තවාදය ඉවර කරල පෙන්නුව. ඒක හරිද වැරදිද කියල කියන්න කියලයි. ජනාධිපතිවරණය ජයග්‍රහණයෙන් පස්සේ එතුමාට රටට ගිහිල්ල කියන්න පුළුවනි. ජනතාව මා ගැන විශ්වාසයක් තියල තිබෙනව. ඒ නිසා මට වැඩකරන්න පුළුවන් ආණ්ඩුවක් ලබාදෙන්න කියල. ජනාධිපතිතුමා තමන් රටට ඉෂ්ඨ කළ යුතු යුතුකම ඉෂ්ඨ කළා දැන් තියෙන්නෙ ජනතාවගේ යුතුකම් ඉෂ්ඨ කළයුතු අවස්ථාවයි. අනෙක් තර්කය මේකයි. ක්‍රිකට් ගහනකොට කැප්ටන් හැම මැච් එකම දිනනව නම් තරගාවලිය මැද කැප්ටන් වෙනස් කරන්නෙ නැහැනේ. ඒක සමාජයට තේරෙන දෙයක්.

**ප්‍රශ්නයඃ- විපක්ෂයේ ප්‍රධාන අපේක්ෂක ජෙනරාල් ෆොන්සේකා මහතා විශාල සහන දෙන්නට සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පොරොන්දු වුණා. රජයත් ඊට සාපේක්ෂව සහන දෙන්න යනව. මේ ආර්ථික සහන අපේ සමාජයට දරා ගන්නට පුළුවන්ද?**

**පිළිතුරුඃ-** මම පෞද්ගලිකව මේ ක්‍රමයට කැමැති නැහැ. මෙතන සිදුවන්නේ නැති සම්පත් වෙන්දේසියක් පමණයි. මෙයට වඩා වෙනස් ආකාරයට රට සංවර්ධනය කළ හැකියි. මේ සියවස ආසියාවේ සියවස කියලයි කියන්නෙ. මෙතනට අවශ්‍ය හරි දේශපාලන නායකයකු පමණයි. ඒ නායකත්වය හා දේශපාලන ඉව ජනාධිපතිතුමා සතුයි. එනිසා ඔය පොරොන්දු නොදී රට එකතු කරල අපට හරි මාර්ගයේ යන්න පුළුවනි.

**ප්‍රශ්නයඃ- රජය නිතරම කතාව මේ මැතිවරණය සඳහා විදේශික බලවේග රැසක් නොයෙක් බලපෑම් කරන බව. විදේශ කටයුතු පිළිබඳ විශේෂඥයකු ලෙස ඔබට එවැන්නක් පේනවද?**

**පිළිතුරුඃ-** මමනම් කියන්නෙ කුමන්ත්‍රණ ගැන නොවෙයි අප බැලිය යුත්තේ යුද්දෙ කරන කාලෙ එක එක කාරණා මත අප රටට විරුද්ධව විදේශ බලවේග ක්‍රියාත්මක වුණා. ඒ බලවේගවල උල්පත් තිබුණෙත් අපේම රටේ. ඩයස්පෝරාව කියන විදේශගත ජන කණ්ඩායමුත් ඒ ව්‍යාපාරයෙ හිටිය. කොටි නායක ප්‍රභාකරන් විනාශ කිරීමත් සමග ඒ ඩයස්පෝරාව එකපාරටම වෛරයෙන් ක්‍රියාකරන්නට පටන් ගත්ත. ඒ අය අදත් තමන්ගේ න්‍යාය පත්‍ර ඇතිව ක්‍රියා කරනවා. අපි මේ සඳහා උපායශීලීව මුහුණ දෙන්න ඕනෑ. ප්‍රශ්නය සංකීර්ණයි. ඒක තේරුම් අරන් අපි ජාත්‍යන්තරය සමග ගනුදෙනු කළ යුතුයි.

**ප්‍රශ්නයඃ- ඔබ කියන්නේ අපට එරෙහි විදේශ බලවේග සමග සටන් නොකළ යුතු බවද?**

**පිළිතුරුඃ-** වේදිකාවලදි නොයෙක් කතා කියන්න පුළුවනි. ඒක සාමන්‍ය ස්වභාවික දෙයක්. නමුත් අපට උදාවී තිබෙන්නේ විශාල අවස්ථාවක්. මේ රටට නිදහස ලැබුණට පසුව උදාවී තිබෙන විශේෂ සුබ මොහොතයි මේ ගතවෙන්නෙ. ඒ නිසා රට එකතු කරල ජාත්‍යන්තරයත් දිනාගෙන අපේ ගමන අප යායුතුයි. ඒත් කිසිම බලවේගයකට අසාධාරණ ලෙස යටත් විය යුතු නැහැ.

**ප්‍රශ්නයඃ- මැතිවරණ අවස්ථාවක ජන මාධ්‍යයේ වගකීම සුවිශාලයි. රාජ්‍ය මාධ්‍ය පාලනයට මැතිවරණ කොමසාරිස්තුමා බලධරයෙක් පත් කළා. එතුමා නාමයෝජනා දිනයේ කිව්ව රාජ්‍ය මාධ්‍ය පමණක් නොව පෞද්ගලික මාධ්‍යයත් පාලනය විය යුතුයි කියල. ඔබ මේ ගැන හිතන්නේ කොහොමද?**

**පිළිතුරුඃ-** මාධ්‍යගැන කතා කරන කොට අලුත් යුගයක අපි ඉන්නෙ. සීමාවල් නැහැ. හුඟක් ප්‍රවෘත්ති කටකතා පවා උපදින්නෙ ඉන්ටර්නෙට් හරහා මාධ්‍ය හරහායි. ඉතින් ඔය මාධ්‍ය පාලනය කියන අදහස් අද ලෝකෙට ගැල පෙන්නෙ නැහැ. කොහෙන්හරි අදහස් මතුවෙනව. අර බලන්න චැනල් 4 සිද්ධිය මාධ්‍ය හරහා ගියා. ඒ වගේ වැරදි හෝ හරි දේවල් මාධ්‍ය හරහා යනවා. ඡන්දය සඳහා බලපාන තත්ත්වයත් ඕකයි. මාධ්‍ය පාලනය කරනව නම් හැම වෙබ් අඩවියකටම පාලනයක් දාන්න වේවි. ඒක කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඡන්දය ගැන වුණත් යම් තොරතුරක් මාධ්‍යයෙන් කිවූ පමණින් ජනතාව භාර ගන්නේ නැහැ. ඒක මැනල කිරල ගන්න ජනතාව දන්නව.

**ප්‍රශ්නයඃ- සමීක්ෂණ වාර්තාවල තිබෙන හැටියට සමස්ථ ඡන්ද දායකයන්ගෙන් 15% ක් පමණ තවමත් තමන්ගේ ඡන්දය දෙන්නේ කාටදැයි තීරණය කරල නැහැ. මේ අය දිනාගන්නට රජය කරන්නේ මොනවාද?**

**පිළිතුරුඃ-** පාවෙන ඡන්ද තීරණාත්මකයි. මේවයි බහුතරය නාගරික ප්‍රදේශවල ඇති. මේ අය බුද්ධිමත් කොටසක්. මොවුන් ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරය තුළ වෙන දේ බලල තීන්දු ගනී. මම මුලින්ම කීව වගේ මේ අවස්ථාව අපට පරම්පරා ගණනකට පසු උදාවී තිබෙන තීරණාත්මක මොහොතයි. ඒ ගැන නිවැරදි ලෙස හිතන්න සමාජයට අනුබල දෙන කරුණු සමාජයට ඉදිරිපත් කරන්න ඕන. අපේක්ෂකයන්ගේ ප්‍රතිපත්ති හා අතීත ක්‍රියා කලාපය අනුව ජනතාව හරි තීන්දුව ගන්න බව මට විශ්වාසයි.

**ප්‍රශ්නයඃ- ඒ හරි තීන්දුව ගන්න බලපාන විශේෂ සාධක මොනවාද**

**පිළිතුරුඃ-** ජනාධිපතිතුමා පසුගිය අවුරුදු 4 කළේ මොනවාද? එතුමාට එල්ලවන චෝදනා ඔප්පු කරල තිබෙනවද? යන්තම් හෝ ඔප්පු කරන්න පුළුවන්ද? සාමාන්‍යයෙන් හැම ඡන්දයේදීම චෝදනා එල්ල වෙනව. ඒ ඉතිහාසයත් පාවෙන ඡන්ද දායකයන් බැලිය යුතුයි. හැම ඡන්දෙකටම කලින් දූෂණය එනවනේ. කාලයක් දූෂණය භීෂණය දෙකම තිබුණා. ගිය ඡන්දයෙදි හෙල්පින් හම්බන්තොට කතාව කීවෙ. ඒ වුණත් ජනතාව තමන් ගන්න ඕනෑ තීන්දුව ගත්ත නේද?

**ප්‍රශ්නයඃ- ඔබේ අවසාන තක්සේරුවේ හැටියට මේ ජනාධිපතිවරණයේ ජයග්‍රාහකයා කව්ද?**

**පිළිතුරුඃ-** අනිවාර්යයෙන්ම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතායි ජයග්‍රාහකයා. ජනාධිපතිතුමා යන ගමන හා හැකියාවට ජනතාව ගරු කරාවි. වෙනත් හේතු කොපමණ තිබුණත් මේ රටින් ත්‍රස්තවාදය තුරන් කළේ ජනාධිපතිතුමායි. ඒ නිසා කළගුණ දත් සමාජය එතුමාට නැවත අවස්ථාවක් දේවි.

**ප්‍රශ්නයඃ- පසුගිය එජාප කාත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී තීරණය කළා එජාපයෙන් රජයට එක්වූ අයට නැවතත් කොන්දේසි විරහිතව පක්ෂයට එන්න අවසර දෙන්න. මේ තීරණයට ඔබේ ප්‍රතිචාරය කුමක්ද?**

**පිළිතුර-** දැන් මම ඉන්නෙ ලංකාවෙ පැරණිම පක්ෂය වන ශ්‍රී ලංකා ජාතික සංගමේ. මගේ අදහසේ හැටියට මේ පක්ෂ ක්‍රමය ගෝත්‍ර ක්‍රමයක් වගෙයි. අපේ පක්ෂ දැන් ගමන් කරන විදියේ වැරදි තිබෙනව. දැන් තිබිය යුත්තේ පක්ෂ එකතු කරන ක්‍රමයක්. එක්සත් ජාතික පක්ෂය අපට නැවත ආරාධනා කරනව කියන තර්කය මගේ දර්ශනයට අදාළ නැහැ. අපි ඉන්න තැන මෙහෙම ඉන්නව. පුළුවන් අවස්ථාවල එකට වැඩ කරනව. මම බලන්නෙ ප්‍රතිපත්ති දිහායි. මම ආණ්ඩුවට ආවය කියල මගේ මුල් මහගෙදර වන එක්සත් ජාතික පක්ෂයට කවදාවත් දොස් කියල නැහැ. ඒ නිසා යනවද එනවද කියන එක නොවේ ප්‍රශ්නය. අපි කොහොමද එකතුවෙලා රටට වැඩ කරන්නෙ කියන එකයි. මම ප්‍රාර්ථනා කරනව ලබන 27 දා සිට ජනාධිපතිතුමාට මුළු රටම එකතු කරන්න පුළුවන් ජනවරමක් ලැබේවා කියලා.

සාකච්ඡා කළේ
**රන්ජිත් ආනන්ද ජයසිංහ**